පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - 77

සෞඛ්‍ය අමාත්‍යාංශය

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்ற வெளியீட்டு தொடர் இல - 77

சுகாதார அமைச்சு

பாராளுமன்ற அரச கணக்குகள் குழுவினால் முன் வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியல் கட்டளை இலக்கம் 119(4)இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்

Parliamentary Series Number – 77

Ministry of Health

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No. 119(4)

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංකය - 77

ආයතනයේ නම - සෞඛ්‍ය අමාත්‍යාංශය

කමිටුව විසින් හඳුනාගනු ලැබූ දුර්වලතාවයන්	දුර්වලතාවයන් නිවැරදි කිරීමට ආයතනය විසින් ගනු ලැබූ පියවර හා වර්තමාන තත්ත්වය
රෝහල් වල සායනික අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම	සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඉහළ නිලධාරීන්, ප්‍රජා වෛද්‍ය විශේෂඥයන්, සෞඛ්‍ය සේවා ආයතන ප්‍රධානීන්, පරිසර අමාත්‍යාංශ නියෝජිතයන් හා මධ්‍යම පරිසර අධිකාරියේ නියෝජිතයන්ගේ දායකත්වයෙන් සෞඛ්‍ය ආරක්ෂණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර අවසන් කරන ලදි. කසල කළමනාකරණ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම මත පදනම් ව පලාත් සෞඛ්‍ය ආරක්ෂණ අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්ම පළාත් 09 ට අදාලව සකස් කරන ලදී.
ජාතික මෙහෙයුම් කමිටුව	2024 වර්ෂය සඳහා වූ සායනික අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා වූ ජාතික මෙහෙයුම් කමිටු රැස්වීම 2024 ජනවාරි 11 වන දින පවත්වන ලදී.
සායනික අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය තුල ක්‍රියාත්මක කරන ව්‍යාපෘති	අමාත්‍ය මණ්ඩල තීරණ අනුව අදාල ව්‍යාපෘති සඳහා ගිවිසුම් වලට එළඹ ඇත.
පුද්ගලික සමාගමක් වෙත සායනික කසල ඉවත් කිරීමට ලබා දීමෙන් රජයට විශාල මූල්‍යමය හානියක් සිදුවීම	ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ක්ෂේත්‍රය තුල සායනික අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා 2010 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා රජය විසින් දරන ලද වියදම සහ ඒ සඳහා ලැබුණ විදේශ ආධාර, ප්‍රදානයන් සහ ණය හා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිවල තොරතුරු ඇතුළත් ලිඛිත වාර්තාව 2024.10.08 දින රජයේ ගිණුම් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.
කසල කළමනාකරණය නිසි ලෙස අධීක්ෂණය කිරීම	කසළ කළමනාකරණය පිළිබඳ අධීක්ෂණය මධ්‍යම පරිපර අධිකාරිය මගින් සිදු කරනු ලබයි.
කුරුණෑගල රෝහල තුළ උද්ගත වී ඇති සායනික අපද්‍රව්‍ය බැහැර කිරීමේ ගැටළුව	විගණන නිරීක්ෂණයේ සඳහන් පරිදි 2022 වර්ෂය තුළ එකතු වී ඇති සායනික අපද්‍රව්‍ය සිසිලි හනාරෝ එන්කෙයා ආයතනය මගින් බැහැර කර අවසන් කරන ලදි. වර්තමානය වන විට රෝහල සතුව ඇති දහනාගාරය සහ හලාවත දිස්ත්‍රික් මහ රෝහලේ ඇති දහනාගාරය මගින් කුරුණෑගල ශික්ෂණ රෝහලේ ඇති තියුණු හා ආසාධිත අපද්‍රව්‍ය කළමනාකරණය කරනු ලබයි.

අපද්‍රව්‍ය ඉවත් කිරීමට යොදා ගන්නා ඇසුරුම් ප්‍රමිතියෙන් තොර බව	සෞඛ්‍ය අමාත්‍යාංශය, සිසිලි හනාරෝ ආයතනය හා මධ්‍යම පරිසර අධිකාරිය හා ඇතිකරගත් ත්‍රෛපාර්ශවීය ගිවිසුම සම්බන්ධයෙන් අදාල සෞඛ්‍ය ආයතන ඇණුවත් කර ඇත. විගණනය විසින් පෙන්වා දී ඇති කරුණු අනුව DDG/E&OH/EH/16/2022 හා 22 ජුනි 2023 දිනැති ලිපිය මඟින් සිසිලි හනාරෝ ආයතනය මඟින් සායනික අපද්‍රව්‍ය බැහැර කරන රෝහල් ප්‍රධානීන් වෙත එම ආයතනයට වැඩිපුර ගෙවන ලද මුදල් අයකර ගැනීමට කටයුතු කරන ලෙස දැනුම් දෙන ලදී. ඒ අනුව අදාල රෝහල් මඟින් අයකරගැනීම් කටයුතු සිදු කරමින් පවතී.
කසල කළමනාකරණය සම්බන්ධයෙන් බලපත්‍ර නිකුත් කිරීම	2024 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේ දී රෝහල් වල ජනනය වන අප ජලය බැහැර කිරීමේ පද්ධති ස්ථාපිත කිරීම යන මැයෙන් (Improvement of the Liquid Waste Disposal System in Healthcare Setting) රෝහල් වෙතින් ඇස්තමේන්තු කැඳවන ලදී. ඒ අනුව අවිස්සාවේල්ල හා හෝමාගම යන පළාත් සභා රෝහල් වෙත ප්‍රතිපාදන වෙන්කර දීමේ කටයුතු සිදු කරමින් පවතී.
පරස්පර විරෝධී නිර්දේශ	මෙටාමයිසර් යන්ත්‍ර මඟින් සායනික අපද්‍රව්‍ය ජීවානුහරණයට අපද්‍රව්‍ය කිලෝවක් සඳහා රු.23 ක් වැයවන බව 2012 මාර් තු 12 වාර්තාවක් මඟින් පෙන්වා දී ඇත. එම ගණනය කිරීම් සිදුකර ඇත්තේ එම යන්ත්‍ර සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් සේවා හා නඩත්තු කටයුතු සිදු කරනවා යන උපකල්පනය මතය. එමෙන්ම 2013 දෙසැම්බර් 12 වන විට බාහිර පාර්ශවයක් වන බයෝමෙඩ් ඉන්ටර්නැෂනල් පුද්ගලික සමාගම සහ සෞඛ්‍ය අමාත්‍යාංශය අතර සේවා හා නඩත්තු ගිවිසුමක් අත්සන් කර තිබුණි. එහි දත්ත පදනම් කරගෙන අපද්‍රව්‍ය කිලෝ ග්‍රෑම් එකක් සඳහා රු.212 වැය වන බව 2018 ජුනි 22 දිනැති කැබිනට් මණ්ඩලයට යොමුකළ සටහනේ සඳහන් කර තිබුණි.
කසල කළමනාකරණය සඳහා වෙන්වූ ආයතනයක් ස්ථාපිත කිරීම	කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේෂ අනුව ඉදිරියේ දී කටයුතු කිරීමට බලාපොරොත්තු වේ.
රෝහල් වල සායනික අපද්‍රව්‍ය බැහැර කිරීමේදී රජයට සිදුවන මූල්‍යමය හානි	2024 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේ දී සෘජුවම ආසාධිත අපද්‍රව්‍ය ගබඩා පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය ඇස්තමේන්තු (Construction, Expansion & Repair of the Healthcare Waste Storage & Ash Pit) ඇස්තමේන්තු කැඳවූ අතර හලාවත දිස්ත්‍රික් මහ රෝහල වෙත මේ වන විටත් 111-1-5-2001(11) වැය ශීර්ෂය යටතේ රු. 7,188,316.87 ක් හා රිජ්වේ ආර්යා ළමා රෝහල වෙත 111-1-5-2001(11) වැය ශීර්ෂය යටතේ රු. 118,800/- ක ප්‍රතිපාදන ලබා දී ඇත.

පොකුරු ක්‍රමය ක්‍රියාත්මක කිරීම	මේ වන විට පළාත් 09 ට අදාව ක්‍රියාකාරී සැලැස්ම සකස් කර අවසන් කර ඇති අතර එහි මෙම පොකුරු සැලැස්ම පිළිබඳව ක්‍රියාමාර්ගයන් ඇතුලත් කර ඇත. පළාත්සභා යටතේ ඇති රෝහල් වල මෙම පොකුරු ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ වගකීම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් වෙත පවරා ඇත.
ව්‍යාපෘති මෙහෙයුම් ගාස්තු	ඕස්ට්‍රේලියානු ණය ආධාර යටතේ ක්‍රියාත්මක වන සායනික අපද්‍රව්‍ය ක්‍රියාත්මක අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ මෙහෙයුම් කටයුතු සිදුකල Biomed International PVT Ltd වෙනුවෙන් ගෙවා ඇති මුදල් සම්බන්ධයෙන් වන තොරතුරු රජයේ ගිණුම් කාරක සභාව වෙත 2022.12.23 දින යොමුකර ඇත.
සායනික අපද්‍රව්‍ය දහනය කිරීමෙන් ඉතිරිවන අපද්‍රව්‍ය පළාත් පාලන ආයතන විසින් අපහරණය කිරීම	මෙටාමයිසර් යන්ත්‍රය මගින් බැහැර කරන ශේෂ ද්‍රව්‍ය බැහැර කිරීම පහත රෝහල් 8 ක් සම්බන්ධව ගැටළුවක් පැවතිනි. 1. දිස්ත්‍රික් මහ රෝහල කෑගල්ල 2. ශික්ෂණ රෝහල කුලියාපිටිය 3. ශික්ෂණ රෝහල රත්නපුර 4. ශික්ෂණ රෝහල අනුරාධපුර 5. ශික්ෂණ රෝහල බදුල්ල 6. දිස්ත්‍රික් මහ රෝහල ඇඹිලිපිටිය 7. මූලික රෝහල කරවනැල්ල 8. මූලික රෝහල මාරවිල වර්තමානය වන විට දිස්ත්‍රික් මහ රෝහල කෑගල්ල සහ ශික්ෂණ රෝහල කුලියාපිටිය යන රෝහල් වල ඇති මෙටාමයිසර් යන්ත්‍රය මගින් බැහැර කරන ශේෂ ද්‍රව්‍ය දොම්පේ පිහිටි සනීපාරක්ෂක බිම්පිරවුමට බැහැර කිරීමට මධ්‍යම පරිසර අධිකාරිය අනුමැතිය ලබා දී ඇත. එමෙන්ම ශික්ෂණ රෝහල රත්නපුර මෙටාමයිසර් යන්ත්‍රය මගින් බැහැර කරන ශේෂ ද්‍රව්‍ය නගර සභාව විසින් බැහැර කිරීමට එකග වී ඇත.

වෛද්‍ය නලින්ද ජයතිස්ස ,
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍ය.

වෛද්‍ය නලින්ද ජයතිස්ස (පා.ම.)
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍ය
ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.
අංක 385, "සුවසිරිපාය",
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.